*සැ. යු.*–2007.08.10 වැනි දින පළ වූ අංක 1,510 දරන *ගැසට් පත්‍රයෙහි* IV(අ) කොටස සහ II කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 1,511- 2007 අගෝස්තු 17 වැනි සිකුරාදා - 2007.08.17

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ජෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 746 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | 746 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... .. | 746 |
| මිළ පාලන දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 746 |
| නැවියන්ට දැන්වීම් .. ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 අගෝස්තු මස 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 අගෝස්තු මස 10 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2007 අංක 314

DRF/RECT/86(VI) AY.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව-ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම

පහත සඳහන් කෙඩෙට් නිලධාරි/නිලධාරිණියන් ඔවුන්ගේ නම ඉදිරියෙන් දක්වා ඇති දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බල හමුදාවේ දෙවෙනි ලුතිනන් නිලයෙන් අධිකාරියට පත්කිරීම සහ එදිනම සිට බලපැවැත්වෙනසේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය වෙත ඇතුලත් කරනු ලැබීම අනුමත කිරීමට, අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රසාදය පල කරනු ලැබ තිබේ.

සී/56313 කෙඩෙට් නිලධාරිණී දේවල මුණි රංගිකා වික්‍රමසිංහ - 2005.11.30
සී/56193 කෙඩෙට් නිලධාරිණී මාරසිංහ මුදියංසේලාගේ ගයත්‍රී චාවින්දි මාරසිංහ - 2006.0428
සී/56306 කෙඩෙට් නිලධාරිණී ලක්ෂිකා ඉමානි මාදඑවගේ - 2006.04.28
සී/56232 කෙඩෙට් නිලධාරි මුතුවාඩාගේ දිනේෂ් පෙරේරා - 2006.09.30

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ජූලි මස 25 වැනි දින,
කොළඹ දී ය.

08-593

# අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2007 අංක 315

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :–

ඩී. කේ. හෙට්ටිආරච්චි මහතා 2007 මැයි මස 03 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වශයෙන්

08-627

# ආණ්ඩුවේ නිවේදන

ඩීඑස්/ඊපී/එච්/කෝවිල්/34/බී.

වන්දනා ගමන් ආඥා පනත – සිත්තාණ්ඩි ශ්‍රී චිත්තිර වේලායුද සුවාමි කෝවිල් උත්සවය- 2007

යතෝක්ත උත්සවය 2007 අගෝස්තු මස 13 වැනි දින පටන්ගෙන 2007 අගෝස්තු මස 28 වැනි දින දක්වා පවත්වනු ලබන මෙම උත්සවයට වන්දනා සඳහා පැමිණෙන අයගේ සහ අනෙකුත් සියලුදෙනාගේම දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශ කරමි.

1948.07.16 වැනි දින අංකය 9886 දරන ආණ්ඩුවේ *ගැසට් නිවේදනයේ* සඳහන් නිත්‍ය නියෝගයන් කෙරෙහි මෙම උත්සව සමයේදී එහි උත්සවයට පැමිණෙන සියල්ලන්ගේ හා අනෙකුත් අයගේ අවධානය මෙයින් යොමු කරවමි.

ප්‍රාදේශීය ලේකම්.
එරාවූර් පත්තු.

08-456

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

මහජන බැංකුව-ආනමඩුව ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.10.20 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දංකොටුව ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. එප්. රන්දෙනිය මහතා විසින් සහතික කරන ලද 2001.06.06 දිනැති අංක 9727 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, මොහම්මදු අනිෂු මොහම්මදු සිද්දික් සහ අහමදු ලෙබ්බේ මොහම්මදු අනිපු *හෙවත්* අහම්මදු ලෙබ්බේ සම්සුදීන් යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් හාරලක්ෂ අනූතුන් දහසක (රු. 4,93,000) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2005.10.14 දින සිට වර්ෂයකට 29% බැගින් රුපියල් හාරලක්ෂ අනූතුන් දහසක (රු. 4,93,000) මුදල සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම්, ඒවා අඩුව එකී රුපියල් හාරලක්ෂ අනූතුන් දහසක

(රු. 4,93,000) මුදල අයකර ගැනීම සඳහා මීගමුව බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා මහතා විසින් එකී අංක 9727 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙනදේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

1. වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, පල්ලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, කුමාර පල්ලම් පත්තුවේ 663/ඒ මදවක්කුලම ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ මැදවක්කුලම නමැති ගමේ පිහිටි වෙට්ටුකුලිවත්ත නමැති රජයේ ඉඩමට ඩී. ප්‍රසාද් විමලසේන බලයලත් මානක විසින් 2001.01.14 වැනි දින මැන සාදන ලද අංක 4484 දරන පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : මීටර් 06 ක් පළල පාර සඳහා වෙන් කර ඇති බිම් තීරය ද, නැගෙනහිරට : කාසි ලෙබ්බේට අයිති ඉඩම ද, දකුණට : ප්‍රාදේශීය සභා පාර ද, බස්නාහිරට : ඉබුනු සලාම්ට අයිති ඉඩම ද, යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර දෙකක් (අ. 02, රූ. 00, පර්. 00) විශාල ඉඩමේ බිම සහ ඊට අයත් ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලු දේත් වේ.

2. වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, පල්ලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, කුමාරපල්ලම් පත්තුවේ 663/බී වැටිය ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ කඩයන්දළුව නමැති ගමේ පිහිටි රජයේ ඉඩමට ඩී. ප්‍රසාද් විමලසේන බලයලත් මානක විසින් 2001.06.02 දින මැන සාදන ලද අංක 4583 දරන පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : ආර්. සරිපුගේ ඉඩම ද, නැගෙනහිරට : එච්. අයි. අසන් කුදුද්ගේ ඉඩම ද, දකුණට : ටී. ඒ. අහමදු ලෙබ්බේගේ ඉඩම ද, බස්නාහිරට : ප්‍රාදේශීය සභා පාර ද යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර එකක් (අ. 01, රූ. 00, පර්. 00) විශාල ඉඩමේ බිම සහ ඊට අයත් ගහකොළ, පළතුරු ගොඩනැගිලි ආදී සැම සියලු දේත් මේ සමග වේ.

මෙම ඉඩම පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO 241/87 සහ 238/90 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
හලාවත.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 79, මාරවිල පාර,
නාත්තන්ඩිය.

08-570

---

## මහජන බැංකුව-මහරගම ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඇ වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඇ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.02.23 වැනි දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරගත් බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුවේ නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. සී. ඉඳුරුව මහත්මිය විසින් සහතික කරන ලද 2004 නොවැම්බර් මස 25 වැනි දින අංක 1854 සහ 2005 මාර්තු 21 වැනි දින අංක 1985 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු ගෙවීම් කිරීම සබරගමු ආරච්චිගේ ඉනෝකා ප්‍රියදර්ශනී සහ අටළුගමගේ පාලිත ප්‍රභාත් සිල්වා විසින් පැහැර හැර ඇති හෙයින්, දැන් එකී බැඳුම්කර මත රුපියල් දෙලක්ෂ තිස් නවදහස් හැට නවයයි ශත තිස් පහක (රු. 2,39,069.35) මුදලක් සහ රුපියල් හතලිස් දෙදහස් හාරසිය හැත්තෑ එකයි ශත හැටහතරක (රු. 42,471.64) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, රුපියල් දෙලක්ෂ තිස් නව දහස් හැටනවයයි ශත තිස් පහක (රු. 2,39,069.35) එකී මුදල සහ 2005 ඔක්තෝබර් මස 26 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඒ මත වර්ෂයකට සියයට පහළොවයි දශම හතයි පහ (15.75%) බැගින් තවදුරටත් වූ පොළිය ද රුපියල් හතලිස් දෙදහස් හාරසිය හැත්තෑ එකයි ශත හැටහතරක (රු. 42,471.64) මුදලක් සහ 2006 අප්‍රේල් මස 30 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයට සියයට දහඅටයි දශම දෙකයි පහ (18.25%) බැගින් තව දුරටත් වූ පොළිය ද විකිණීමේ ගාස්තු ද එකී මහජන බැංකු පනතේ 29ඕ වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු, අයකර ගැනීම සඳහා අංක 1854 හා 1985 දින දරන උකස් බැඳුම්කර මගින් එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු අර්වින් පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ පමුණුව පාරේ පිහිටියා වූ ද, බලයලත් මිනින්දෝරු ඩී. ඩබ්. අබේසිංහ විසින් සාදන ලද අංක 4913 සහ 1995 මැයි මස 21 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 5ඒ ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : බලයලත් මිනින්දෝරු ඩී. එස්. හෙට්ටිගේ විසින් සාදන ලද අංක 389 දරන පිඹුරේ ලොට් අංක 4 දරන පළමුවන පටුමගේ වරිපනම් අංක 13/7 ද, නැගෙනහිරට : (අඩි 10 ක් පළල පාර සඳහා වෙන් කිරීම වන) ලොට් 5සී කොටස ද, දකුණට : අඩි 20ක් පළල පාර සඳහා වෙන් කිරීම වන ඉඩම් කොටස ද, බස්නාහිරට : ලීලා සෙනෙවිරත්නට අයිති ඉඩම ද, මායිම් වන්නා වූ ද, පර්චස් හතයි දශම එකයි පහක් (අ. 0, රූ. 0, පර්. 7.15) ක් විශාල වූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස මුළු සහ එහි පිහිටි වරිපනම් අංක 13/8 දරන නිවස ද වේ.

ඉහත කී මහරගම පමුණුව පාරේ පිහිටියා වූ ද ඉහත කී අංක 4913 දරන පිඹුරේ නිරූපණය කර ඇත්තා වූ ද උතුරට : මෙම ඉඩමේ කොටසක් වන ලොට් 5බී කොටස ද, නැගෙනහිරට : එක්සත් සුභ සාධක මාවතට වැටෙන 1 වන පටුමඟ ද, දකුණට : අඩි 20ක් පළල පාර සඳහා වෙන් කිරීම වන ඉඩම් කොටස ද, බස්නාහිරට : ලොට් 5ඒ දරන කොටස ද මායිම් වන්නාවූ ද පර්චස් දෙකක් (අ. 0, රූ. 0, පර්. 2) ක් විශාල වූ ද ලොට් 5සී ලෙස ලකුණු කළ (අඩි 10ක් පළල පාර සඳහා වෙන් කිරීම වන) මුළු ඉඩම් කොටස.

ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්. 2811/7, 2109/156 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
බටහිර කලාප II

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
(කොළඹ පිටත),
අංක 177, හයිලෙවල් පාර, නුගේගොඩ.

08-565

## මහජන බැංකුව-යක්කල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.04.27 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගත් බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2003.01.31 දිනැති අංක 7755 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් යාපා අප්පුහාමිලාගේ ජීවක සුජීව නිශාන්ත සහ යාපා අප්පුහාමිලාගේ ස්වර්ණලතා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් හාරලක්ෂ පනස්දහස් නවසිය අසූනමයයි ශත හැට නමය (රු. 4,50,989.69) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2005.02.02 දින සිට වර්ෂයකට 23% බැගින් රුපියල් හාරලක්ෂ පනස්දහස් නමසිය අසූනමයයි ශත හැට නමය (රු. 4,50,989.69) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හාරලක්ෂ පනස්දහස් නමසිය අසූනමයයි ශත හැට නමය (රු. 4,50,989.69) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 7755 දරන උකස් කරය මගින් එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටත තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ, මැද පත්තුවේ, යක්කල, කෙහෙල්වතුගොඩ පිහිටි යක්කල එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ජී. එන්. ජයසුන්දර විසින් 2002.06.08 වැනි දින මැන සකස් කල අංක 2065 දරන පිඹුරේ ලොට් අංක බී1 දරන කොටසට මායිම්, උතුරු-නැගෙනහිරට : සෙනෙහෙලතා ලොකුබාලසූරියට අයත් ඉඩම ද, දකුණු-නැගෙනහිරට : පාර (ආර්. ඩී. ඒ.) ද, දකුණු-බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස (පිඹුරු අංක 1111ඒ හි ලොට් බී හි කොටසක් ද) ද, උතුරු-බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස (පිඹුරු අංක 1111ඒ හි ලොට් බී හි කොටසක් ද) යන මායිම් තුළ පිහිටි පර්චස් හතර (අ. 0, රූ. 0, පර්. 4) ක විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම් ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 573/250 හි ලියාපදිංචි කර ඇත. එකී පිඹුරේ දැක්වෙන මාර්ගවල මාර්ග අයිතිය ද සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
බටහිර III කලාප කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

08-564

## මහජන බැංකුව-හික්කඩුව (136) ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2004.07.28 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. ඩී. මුදිතා පීරිස් විසින් සහතික කරන ලද 1997.10.14 දිනැති අංක 1066 දරන උකස් ප්‍රකාර ගෙවීම් ගාල්ලගේ දයාරත්න යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් පනස් හත්දහස් එකසිය පනස් පහ (රු. 57,155)ක මුදලක් සහ රුපියල් එක් ලක්ෂ පන්දහස් පන්සිය හැත්තෑ හයයි ශත දහසයක (රු. 1,05,576.16) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2000.02.23 දින සිට වර්ෂයට 26% බැගින් රුපියල් පනස් හත්දහස් එකසිය පනස් පහක (රු. 57,155) මුදලක් සඳහා ද 2000.06.30 දින සිට වර්ෂයට 29% බැගින් රුපියල් එක්ලක්ෂ පන්දහස් පන්සිය හැත්තෑ හයයි ශත දහසයක (රු. 1,05,576.16) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් පනස් හත්දහස් එකසිය පනස් පහයි (රු. 57,155) මුදල සහ රුපියල් එක්ලක්ෂ පන්දහස් පන්සිය හැත්තෑ හයයි ශත දහසයක (රු. 1,05,576.16) මුදල අයකර ගැනීම සඳහා කැස්බෑව බලයලත් වෙන්දෙසිකාර ඒ. එස්. ලියනගේ විසින් එකී අංක 1066 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙනදේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, හික්කඩුව ප්‍රාදේශීය සභාවේ, දොඩන්දූව උප කාර්යාලය සීමාවේ, මෝදර පටුවත, දොඩන්දූව පාරේ වරිපනම් අංක 8බී දරන මරදානේ ඕවිට නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. සී. විජේවික්‍රම විසින් 1997.06.15 වැනි දින මැන සාදන ලද අංක 709 දරන පිඹුරේ ලොට් අංක 03 දරන කොටසට මායිම්, උතුරට : දොඩන්දූවගොඩ පාර ද, නැගෙනහිරට : අම්පිටිය වත්ත ද, දකුණට : විලියම් ජයසූරියට අයත් මෙම ඉඩමේම කොටසක් ද, බස්නාහිරට : අංක 709 දරන පිඹුරේ අංක 1 වශයෙන් දක්වා ඇති මෙම ඉඩමේම කොටසක් වන ගාල්ලගේ කරුණාරත්නට අයත් ඉඩම සහ අංක 709 දරන පිඹුරේ අංක 2 වශයෙන් දක්වා ඇති මෙම ඉඩමේම කොටසක් වන ගාල්ලගේ විජේරත්නට අයත් ඉඩම් කැබැල්ල ද යන මෙකී මායිම් තුළ වූ පර්චස් විසිඑකයි දශම හතයි හතරක් (අ. 0, රූ. 0, පර්. 21.74)ක විශාල ඉඩම සහ එකී පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියලු දේත් වේ.

මෙම ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඩී584/277 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22, පහළ ඩික්සන් පාර,
ගාල්ල.

08-569

## මහජන බැංකුව - රුජිණ ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනාව 2006 සැප්තැම්බර් මස 22 වැනි දින පැවති ඔවුන්ගේ රැස්වීමේදී ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

මහජන බැංකුවේ වාසියට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. එස්. ඩබ්. අමරසිංහ මිය. විසින් සහතික කරන ලද අංක 6804 හා 2003.09.17 දින දරන උකස් බැඳුම්කරය මත නියමිත ගෙවීම් සිසිල් ද අල්විස් පණ්ඩිත *හෙවත්* සිසිල් ද පණ්ඩිත් පැහැර හැර ඇති බැවින් එකී අංක 6804 දරන උකස්කර බැඳුම්කරය මත රුපියල් පහළොස් ලක්ෂයක් (රු. 15,00,000) වන මුදල මහජන බැංකුවට දැන් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇත. එකී රුපියල් පහළොස් ලක්ෂයක (රු. 15,00,000) වන මුදල ද 2005.0721 වැනි දින සිට විකිණීමේ දිනය තෙක්, රුපියල් පහළොස් ලක්ෂයක් (රු. 15,00,000) වන මුදල මත වර්ෂයකට 20% බැගින් තවදුරටත් පොළිය ද විකුණුම් පිරිවැය හා වෙනත් ගාස්තු ද එදින තෙක් ලැබී ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසුව අයකර ගැනීම සඳහා එකී අංක 6804 දරන උකස් බැඳුම්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, හික්කඩුව නගර සභා සීමාව තුළ, වැවල පිහිටි බෝපේහාමිනේගේවත්ත, බෝපෙඇත්තන්ගේවත්ත *හෙවත්* බෝපේඇන්ටන්ගෙ කැබැල්ල *හෙවත්* මුදිල්ලාගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩී. වීරසේකර විසින් සාදන ලද අංක 427පී හා 1973.06.23 දින දරන පිඹුරේ ලොට් 6 වශයෙන් දක්වා ඇති බෙදා වෙන් කරන ලද ඉඩම් කට්ටිය වන එකී ලොට් 6ට මායිම්, වයඹ දිශාවට : ලොට් 17 ද, ඊසාන දිශාවට : ලොට් 7 ද, දකුණට : ලොට් 9 සහ බස්නාහිරට : ලොට් 5 ද මායිම් වූ එකී අංක 427පී දරන පිඹුර ප්‍රකාර පර්චස් එකයි දශම අටයි පහයි හත (අ. 0, රු. 0, පර්. 1.8570) ක් විශාල ඉඩම් කට්ටිය සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි සහ අනිකුත් සෑම සියලු දේත් වේ. මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 594/140හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී වැවල පිහිටි බෝපෙහාමිනේගේවත්ත, බෝපෙඇත්තන්ගේවත්ත *හෙවත්* බෝපේඇන්ටන්ගෙකැබැල්ල *හෙවත්* මුදිල්ලාගහවත්ත නමැති ඉඩමේ අංක 427පී දරන එකී පිඹුරේ ලොට් 7 වශයේ දක්වා ඇති බෙදා වෙන් කරන ලද ඉඩම් කට්ටිය වන එකී ලොට් 7ට මායිම්, වයඹ දිශාවට : ලොට් 17 ද, ඊසාන දිශාවට : ප්‍රධාන පාර ද, දකුණට : ලොට් 8 සහ 9 ද, බස්නාහිරට : ලොට් 6 ද මායිම් වූ එකී අංක 427පී දරන පිඹුර ප්‍රකාර පර්චස් හයයි දශම අටයි බින්දුවයි නවය (අ. 0, රු. 0, පර්. 6.8090) ක් විශාල ඉඩම් කට්ටිය සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි සහ අන් සෑම සියලු දේත් වේ. මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 596/72හි ලියාපදිංචි කර තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කලාපය - 01).

මහජන බැංකුව,
කලාපීය ප්‍රධාන කාර්යාලය,
(බටහිර කලාපය),
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

08-568

---

## මහජන බැංකුව - බටපොළ (234) ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2004.09.29 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ජී. දුල්මිණී සුනාරි විසින් සහතික කරන ලද 2003.07.22 දිනැති අංක 706 සහ අංක 705 දරන උකස්කරයන් ගෙවීම බටුවත්ත ගමගේ රෝහණ ජයතිස්ස සහ වතුදුර මාලා කාන්ති යන අය වලුන් විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරයන් යටතේ දැනට රුපියල් හත් ලක්ෂයක (රු. 7,00,000) මුදලක් සහ රුපියල් ලක්ෂ තුනක (රු. 3,00,000) මුදලක් සහ මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2003.11.20 දින සිට වර්ෂයට 19% බැගින් රුපියල් හත්ලක්ෂයක (රු. 7,00,000) මුදලක් සහ 2004.07.30 දින සිට වර්ෂයකට 20% බැගින් රුපියල් ලක්ෂ තුනක (රු. 3,00,000) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හත් ලක්ෂයක (රු. 7,00,000) මුදල සහ රුපියල් ලක්ෂ තුනක (රු. 3,00,000) මුදලක් අයකර ගැනීම සඳහා ගාල්ල බලයලත් වෙන්දේසිකාර කේ. ටී. පී. ගුරුගේ විසින් එකී අංක 705 සහ 706 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, බටපොළ පිහිටි යහලගොඩ වත්ත නමැති ඉඩමේ කැබලි අංක 3ට බලයලත් මානක සී. ටී. ද එස්. මනුකුලසූරිය විසින් සකස් කළ අංක 690 පිඹුර පරිදි මායිම්, උතුරට : මහජන වැඩ දෙපාර්තමේන්තු පාර (පී. ඩබ්. ඩී. පාර) ද, නැගෙනහිරට : එම ඉඩමේ කැබලි අංක 2 ද, දකුණට : අත්තගෙවත්ත සහ බෙලිඅත්ත වෙල හා බස්නාහිරට : එම ඉඩමේම කැබලි අංක 4 යන මායිම් තුළ වූ පර්චස් දහසයයි දශම තුනක් (අ. 0, රු. 0, පර්. 16.3) විශාල ඉඩම සහ එහි ඇති ගොඩනැගිලි, ගහකොළ, වැවිලි ඇතුළු සියලු දෑ වේ.

ඉහත සඳහන් ඉඩම පහත සඳහන් පරිදි ද විස්තර වේ :

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, බටපොල පිහිටි යහලගොඩ වත්ත නමැති ඉඩමේ කැබලි අංක 3ට බලයලත් මානක ඩබ්. ඒ. විලියම් සිල්වා විසින් සකස් කළ 1973.07.03 දිනැති අංක 690 දරන පිඹුරේ නිරූපිත පරිදි මායිම්, උතුරු-නැගෙනහිරට : බටපොල සිට බද්දේගමට ප්‍රධාන පාර ද, දකුණු-නැගෙනහිරට : එම ඉඩමේ කැබලි අංක 2 ද, දකුණු-බටහිරට : බෙලිඅත්තවෙල සහ ආත්තගෙවත්ත සහ උතුරු-බස්නාහිරට : එම ඉඩමේම කැබලි අංක 4 යන සීමා මායිම් තුළ වූ පර්චස් දහසයයි දශම තුනක් (අ. 0, පර්. 0, පර්. 16.3) විශාල ඉඩම සහ එහි ඇති ගොඩනැගිලි, ගහකොළ, වැවිලි ඇතුළු සියළු දේද වේ. මෙම ඉඩම ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී 531/57 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22, පහළ ඩික්සන් පාර,
ගාල්ල.

08-571

---

## මහජන බැංකුව- රුහුණ ශාඛාව (033)

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනාව 2006 පෙබරවාරි මස 17 දින පැවති ඔවුන්ගේ රැස්වීමේදී ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුවේ වාසියට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. කේ. එස්. බී. නන්දන මහතා විසින් සහතික කරන ලද අංක 846 හා 2003.12.19 දින දරන උකස් බැඳුම්කරය හා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. එස්. ඩබ්. අමරසිංහ මිය. විසින් සහතික කරන ලද අංක 7019 සහ 2004.06.18 දින දරන උකස් බැඳුම්කරය මත ගෙවීම් සිසිල් ද අල්විස් පණ්ඩිත *හෙවත්* සිසිල් ද පණ්ඩිත් පැහැර හැර ඇති බැවින් අංක 846 හා 7019 දරන එකී උකස්කර බැඳුම්කර ප්‍රකාර පිළිවෙලින් රුපියල් විසිපත් ලක්ෂ හැටහය දහස් හයසිය හැට හයයි ශත හැට අටක් (රු. 25,66,666.68) වන මුදල හා රුපියල් හත්ලක්ෂ හතලිස් අට දහස් හත්සිය අසූ නවයයි ශත හැට දෙකක් (රු. 748,789.62) ක් වන මුදල ද මහජන බැංකුවට දැන් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇත. එකී රුපියල් විසිපත් ලක්ෂ හැටහය දහස් හයසිය හැට හයයි ශත හැට අටක් (රු. 25,66,666.68) වන මුදල හා රුපියල් හත්ලක්ෂ හතලිස් අට දහස් හත්සිය අසූනවයයි ශත හැට දෙකක් (රු. 7,48,789.62) වන මුදලද ඒ සඳහා පිළිවෙලින් 2004.09.06 දින හා 2004.08.17 දින සිට විකිණීමේ දිනය තෙක්, පිළිවෙලින් වර්ෂයකට 18.25% හා 29% බැගින් තවදුරටත් පොලිය ද විකුණුම් පිරිවැය හා වෙනත් ගාස්තු ද එදින තෙක් ලැබී ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසුව අයකර ගැනීම සඳහා එකී අංක 846 හා අංක 7019 දරන උකස් බැඳුම්කර යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු ටී. එස්. රාමනායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ලඩය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, හික්කඩුව නගර සභා සීමාව තුළ, වැවල නමැති ගමේ පිහිටි තුප්පහිරාලලාගේවත්ත, දොඹගහ පට්ටනියේවත්ත *හෙවත්* කෝරලේකංකානම්ගේවත්ත *හෙවත්* බෝම්බගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. ඩී. ඒ. ගුණසේකර විසින් සාදන ලද අංක 1904 හා 1999.11.09 දින දරන පිඹුරේ ලොට් ඒ වශයෙන් දක්වා ඇති ගාලුපාරේ වරිපනම් අංක 410, 410ඒ දරන බෙදා වෙන් කරන ලද ඉඩම් කට්ටිය වන ඊසාන දිශාවට : කොළඹ ගාල්ල ප්‍රධාන පාර ද, ගිණිකොන දිශාවට : දිසා අධිකරණ අංක එල් - 4296 දරන නඩුවට ගොණු කරන ලද අංක 190ඒ දරන පිඹුරේ ලොට් 23 ද, නිරිතදිශාවට : මුහුදු වෙරළ ද, වයඹ දිශාවට : දිසා අධිකරණ අංක එල් 8048 දරන නඩුවට ගොණු කර තිබෙන අංක 3076 දරන පිඹුරේ ලොට් 3 ද මායිම් වූ එකී අංක 1904 දරන පිඹුර ප්‍රකාර රූඩ් එකයි, පර්චස් බිංදුවයි දශම එකයි පහක් (අක්කර 0, රූඩ් 1, පර්. 00.15) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ, පළතුරු හා අන් සෑම සියලු දේත් වේ. මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී780/77 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරි,
(බටහිර කලාපය - 01.)

මහජන බැංකුව,
කලාපීය ප්‍රධාන කාර්යාලය,
(බටහිර කලාපය),
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

08-567

---

## මහජන බැංකුව-කටුගස්තොට ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.07.21 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් අජන්තා කුමාරිහාමි විජේරත්න මහත්මිය විසින් සහතික කරන ලද 1999.09.14 දිනැති අංක 2039 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් වික්‍රමසිංහ මුදියන්සේලාගේ මාලනී කුමාරිහාමි තිලකරත්න සහ මාරස්සන හේරත් මුදියන්සේලාගේ ගුණතිලක බණ්ඩාර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් පන්ලක්ෂ අනූහත් දහස් තුන්සිය පනස්තුනයි ශත විසි හතක (රු. 5,97,353.27) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2005.05.20 වැනි දින සිට වර්ෂයකට 21.5% බැගින් රුපියල් පන්ලක්ෂ අනූහත් දහස් තුන්සිය පනස්තුනයි ශත විසි හතක (රු. 5,97,353.27) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාළ මහජන

බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් පන්ලක්ෂ අනූහත් දහස් තුන්සිය පනස්තුනයි ශත විසි හතක (රු. 5,97,353.27) මුදලක් අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 2039 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙනදේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

## දේපළ පිළිබඳ විස්තරය

1. මධ්‍යම පළාතේ, මහනුවර දිසාවේ, සාරසිය පත්තුවේ, කුළුගම්මන සියපත්තුවේ, බොකලවෙල පිහිටි වලගන්දෙනියේ කුඹුරට අයත් ඔලියාගොඩයාගේ කැප්පෙටියේහේන දැනට වත්තට කේ. ජී. හේරත් අවසරලත් මිනින්දෝරු මහතා විසින් මැන සාදන ලද වර්ෂ 1960ක් වූ ජනවාරි මස 24 වැනි දින සහ අංක 727 දරන පිඹුරේ ප්‍රකාර බෙදා වෙන් කළ අංක 3 දරන කට්ටිය වන පර්චස් විසිඅටකුත් දශම තුනයි හයක් (අ. 00, රු. 00, පර්. 28.36) විශාලකම ඇති උතුරට : මෙම ඉඩමේ අංක 2 දරන කට්ටිය ද, නැගෙනහිරට : දමුණුගහ සහ පුස්සේ මුදුනේ වත්ත ද, දකුණට : මෙම ඉඩමේ අංක 4 දරන කට්ටිය ද, බස්නාහිරට : ගම්සභා පාර ද මායිම් වූ බිම් වාසිය සහ ඊට අයිති ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියළු දේද වේ. (එච් 359/37)

2. එකී ඉහත කී ඉඩම්වලට ආර්. සී. ඕ. ද ලා මොට් අවසරලත් මිනින්දෝරු මහතා විසින් මැන සාදන ලද වර්ෂ 1954ක් වූ ඔක්තෝබර් මස 03 වැනි දින සහ අංක 745 දරන පිඹුරේ ප්‍රකාර බෙදා වෙන් කළ අංක 1 දරන කැබැල්ල වන රූඩ් තුනකුත්, පර්චස් පහළොහකුත් දශම දෙකක් (අ. 00, රු. 03, පර්. 15.2) විශාලකම ඇති උතුරට : කැප්පෙටියේහේන ද, රඹුක්වැල්ලේ ගෙදර උඩ අරඹේ වත්ත සහ ගල්ලිඳ කුඹුරේ අරඹ ද, නැගෙනහිරට : අලකොලදෙනියේ කුඹුරේ ඉවුර ද, දකුණට : 2 සහ 4 දරන කැබලි ද, බස්නාහිරට : අලකොල අංගේ වත්ත *නොහොත්* ඔලිගොඩ හේන ද යන මෙකී මායිම් තුළ ඉඩමේ බස්නාහිර පැත්තේ කැබැල්ල වන රූඩ් එකකුත්, පර්චස් විසිහතකුත් දශම හයක් (අ. 00, රු. 01, පර්. 27.6) විශාලකම ඇති උතුරට : කැප්පෙටියේ හේන ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතුරු කොටස වෙන් වන අළුත්වැට සහ රඹුක්වැල්ලේ ගෙදර උඩ අරඹේවත්ත ද, දකුණට : 4 දරන කැබැල්ල ද, බටහිරට : අලකොල අංගේ වත්ත *නොහොත්* ඔලිගොඩ හේන ද යන මෙකී මායිම් තුළ ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ඩී. දසනායක මහතා විසින් මැන සැකසූ අංක 4215 හා 1999.05.12 දින දරන පිඹුරේ ලොට් අංක 1 හා 2 දරන රූඩ් එකයි, පර්චස් විසිහතයි දශම හයයි බින්දුවක් (අ. 00, රු. 01, පර්. 27.60) විශාලත්වයට එකී පිඹුරේ ප්‍රකාර මායිම්, උතුරට : අල්විස් අප්පුහාමි හිමිකම් කියන කැප්පේටියේහේන ද, නැගෙනහිරට : ඉහත කී අංක 4215 දරන පිඹුරේ ලොට් අංක 3 හා රඹුක්වැල්ලේ ගෙදර උඩ අරඹේවත්ත ද, දකුණට : අංක 745 දරන පිඹුරේ කැබලි අංක 4 ද, දකුණු-බටහිරට : අලකොල අංග වත්ත *හෙවත්* මීගොඩ හේන හා පාර ද යන මායිම් තුළ පිහිටි ඉඩම හා ඒ තුළ පිහිටි වැවිලි, ගොඩනැගිලි, ගසකොළ, පළතුරු ආදී සෑම සියලු දේත් වේ.

මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච් 656/199, 200 දරන පත්ඉරු යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(මධ්‍යම කලාපය).

මහජන බැංකුව,
මධ්‍යම කලාප කාර්යාලය,
අංක 17, දළදා වීදිය,
මහනුවර.

08-572

---

## මහජන බැංකුව- ගාල්ල කොටුව - 013

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.03.23 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. ඩී. මුදිතා පීරිස් විසින් සහතික කරන ලද 2000.11.15 දිනැති අංක 3394, ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් එස්. එච්. ගමගේ විසින් සහතික කරන ලද 2004.08.26 දිනැති අංක 516 සහ ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් එම්. ජී. සී. අරෝෂිනී විසින් සහතික කරන ලද 2005.05.05 දිනැති අංක 277 දරන උකස්කර ප්‍රකාර ගෙවීම්. පසික්කු හැන්නැදිගේ නිමල් සිල්වා සහ කලු මරක්කල කුමුදිනී ද සිල්වා යන අයවලුන් විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් එක්ලක්ෂ පනස්හත් දහස් තුන්සිය හතලිස් දෙකයි ශත නවය (රු. 1,57,342.09) ක මුදලක්, රුපියල් තුන්ලක්ෂ එක්දහස් විසි හතරයි ශත අනූ එකක් (රු. 3,01,024.91) ක මුදලක් සහ රුපියල් පහළොස් ලක්ෂ තිස් එක් දහස් එකසිය තිස් එකයි ශත හතර (රු. 15,31,131.04) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින්ද, 2005.09.16 දින සිට වර්ෂයකට 21% බැගින් රුපියල් එක්ලක්ෂ පනස්හත් දහස් තුන්සිය හතලිස් දෙකයි ශත නවය (රු. 1,57,342.09) ක මුදලක් 2005.09.16 දින සිට වර්ෂයකට 17.25% බැගින් රුපියල් තුන්ලක්ෂ එක් දහස් විසි හතරයි ශත අනූ එකක් (රු. 3,01,024.91) මුදලක් සහ 2006.10.07 දින සිට වර්ෂයකට 17.25% බැගින් රුපියල් පහළොස් ලක්ෂ තිස් එක්දහස් එකසිය තිස් එකයි ශත හතර (රු. 1,531,131.04) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද, සමහ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් එක්ලක්ෂ පනස්හත් දහස් තුන්සිය හතලිස් දෙකයි ශත නවය (රු.1,57,342.09) ක මුදලක්, රුපියල් තුන්ලක්ෂ එක්දහස් විසි හතරයි ශත අනූ එක (රු. 3,01,024.91) ක මුදලක් සහ රුපියල් පහළොස් ලක්ෂ තිස් එක් දහස් එකසිය තිස් එකයි ශත හතර (රු. 1,531,131.04) ක මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 3394,516 සහ 277 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

## උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තර

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාලු කඩවත් සතර තුළ, ගාලු නගර සභා සීමාවේ ඇත්තිලිගොඩ පිහිටි දම්පිට්ටනියකල්ගෙවත්ත ලොට් 1 දරන කැබැල්ල දම්පිට්ටනියවත්ත ලොට් ඊ *නොහොත්* මුදලිලේබ්බෙගෙවත්ත *නොහොත්* බඩල්ගෙවත්ත සහ මුදලියලෙබ්බේගෙවත්ත නොහොත් බඩල්ගෙවත්ත සුධර්මාරාම පාර, ව.ප. අංක 24/3 නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු අජිත් රංජන් වීරසූරිය මහතා විසින් මැන සාදන ලද 1986.02.12 දිනැති අංක 33 දරන පිඹුරේ සඳහන් අංක 1 දරන කැබැල්ලට, උතුරට : දම්පිට්ටනිය කල්ගෙවත්ත ද, නැගෙනහිරට : පිඹුරු අංක 1314 සඳහන් කැබලි අංක 2 ද, දකුණට : පිඹුරු අංක 33 සඳහන් කැබලි අංක 2 ද, බස්නාහිරට : අඩි 18ක් පළල පාර ද, මායිම්ව පර්චස් හයයි දශම නවයයි බිංදුවක් (අක්කර 0, රූඩ් 0, පර්. 6.90) විශාල බිම සහ එහි පිහිටි වැවිලි ගොඩනැගිලි ආදී සියලු දේත් වේ. මෙම ඉඩම ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ අංක ඒ 670/12 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී අංක 33 දරන පිඹුරේ සඳහන් ගාල්ල සිට උඩුගම දක්වා දිවෙන මහා මාර්ගයේ සිට ආරම්භ කෙරෙන අඩි 18ක් පළල පාරේ මාර්ග අයිතිය ද සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22,
පහළ ඩික්සන් පාර,
ගාල්ල.

08-566

---

## ලංකා බැංකුව - වාද්දුව ශාඛාව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වෙනි වගන්තිය යටතේ දැන්වීම

2007.05.17 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

1. මහජන නොතාරිස් ආර්. පී. එම්. ජයසූරිය විසින් සහතික කරන ලද 1994.07.06 දිනැති අංක 56 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2007.01.31 දින තෙක් පොලිය වශයෙන් රුපියල් එකොලොස් ලක්ෂ හතලිස් අටදහස් හාරසිය හැටහයක (රු. 11,48,466) මුදලක් සමග රුපියල් තුන්ලක්ෂ හැටදහසක (රු. 3,60,000) මුදලක් මත වසරකට සියයට විසිඑක (21%) බැගින් පොලියක් සහ අනෙකුත් ගාස්තු, 2007.02.01 වෙනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් වාද්දුව, සෙන්ට්‍රල් පාර, අංක 53/1 හි පදිංචි ගුරුගේ බැසිල් අන්තෝනි ප්‍රනාන්දු මහතා සහ හේවා ෆොන්සේකාගේ හැරියට් ෆොන්සේකා මහත්මිය යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 56 දරන බැඳුම්කරය මත 2007.01.31 දිනට අයවිය යුතු එකී රුපියල් එකොලොස් ලක්ෂ හතලිස් අටදහස් හාරසිය හැටහයක (රු. 11,48,466) මුදලක් සමග විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, අනෙකුත් ගාස්තු ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද, අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 03, ධර්මපාල මාවත, අංක 55ඒ හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරිය) හා එහි සංශෝධනවල 19 වෙනි වගන්තිය යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණ වාද්දු-වස්කඩු දෙබැද්දෙහි මහ වාද්දුව නැගෙනහිර හි පිහිටි මහවත්තේ කොටසක් නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩී. ජේ. පී. මාගොඩරත්න විසින් සාදන ලද 1961 ජූලි 18 දිනැති අංක 986 දරන පිඹුරේ විස්තර කළ ලොට් 10 වශයෙන් සඳහන් බෙදනලද්දාවූ සහ විස්තර කළ ඉඩම් කැබැල්ල උතුරට : මහවත්තේ කොටසක් ද, නැගෙනහිරට : ලොට් 11 ද, දකුණට : ලොට් 23 සහ ලොට් 16 වශයෙන් සඳහන් පාර සඳහා වෙන්කළ කොටස ද, බස්නාහිරට : ලොට් 9 ද, මායිම්ව පර්චස් විසිදෙකහමාරක (අ. 0, රූ. 0, පර්. 22 1/2) ප්‍රමාණයෙන් යුත් ඉඩම වේ. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 4/66 හි ලියාපදිංචි කර ඇත.

ඉහත ලොට් 10 වශයෙන් සඳහන් එකී ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු එල්. පී. එච්. ද සිල්වා විසින් සාදන ලද අංක 6071 දරන මෑත කාලයේ මිනුම් පිඹුරේ පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

එකී නැගෙනහිර මහ වාද්දුව හි පිහිටි මහවත්ත කට්ටිය නැමැති ඉඩමේ එකී අංක. 6071 දරන පිඹුරේ විස්තර කළ ලොට් 10 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : මහවත්ත කට්ටියද, නැගෙනහිරට : අංක 986 දරන පිඹුරේ ලොට් 11 ද, දකුණට : අංක 986 දරන පිඹුරේ ලොට් 23 (අඩි 15 ක් පළල පාර) සහ ලොට් 16 ද, බස්නාහිරට : අංක 986 දරන පිඹුරේ ලොට් 9 ද, මායිම්ව එකී අංක 6071 දරන පිඹුර අනුව පර්චස් විසිඑකයි දශම හතයි පහක (අ. 0. රූ. 0, පර්. 21.75) ප්‍රමාණයෙන් යුත් ඉඩම සමග එහි පිහිටි ගහකොළ වැවිලි ගොඩනැගිලි සහ වැවෙන දේද වේ.

තවද, එකී මහ වාද්දුව හි පිහිටි මහවත්ත කට්ටිය නමැති ඉඩම අංක 986 දරන පිඹුරේ විස්තර කළ ලොට් 23 වශයෙන් සඳහන් බෙදනලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල මත පාරේ අයිතිය සමග උතුරට : ලොට් 10, 11, 12, 13 ද, නැගෙනහිරට : සෙන්ට්‍රල් පාර ද, දකුණට : ලොට් 14, 15 ද, බස්නාහිරට : ලොට් 16 ද, මායිම්ව එකී අංක 986 දරන පිඹුර අනුව පර්චස් එකොළහමාරක (අ. 0, රූ. 0, පර්. 11 1/2) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 37/13 හි ලියාපදිංචි කර ඇත.

ඒ. චන්ද්‍රපාල,
කළමනාකරු.

ලංකා බැංකුව,
වාද්දුව ශාඛාව.

08-607